## පළාත් පාලන ආයතන සඳහා තේරී පත් වූ කාන්තා සභිකයින්ගේ
## ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන
## කොළඹ, කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක

**කොළඹ දිස්ත්‍රික්කය**

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ජාතික කාන්තා කමිටුව විසින් සංවිධානය කරන ලද මෙවර පළාත් පාලන ආයතන සඳහා තේරී පත් වූ කාන්තා සභිකයින් ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් මාලාවේ කොළඹ දිස්ත්‍රික් වැඩසටහන 2018.07.24 දින, මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලිය ශ්‍රවණාගාරයේදී පෙ. ව. 8.30 - ප. ව. 3.30 දක්වා පවත්වන ලදී.

දිස්ත්‍රික් වනිතා සංවර්ධන නිලධාරී වැඩසටහන ආරම්භ කරමින් පැමිණ සිටි පිරිස පිලිගනිමින් මෙම වැඩසහනේ අරමුණ ජාතික කාන්තා කමිටුවේ සභාපති ස්වර්ණා සුමනසේකර මහත්මිය විසින් පැහැදිලි කරන ලදී. ඉන් අනතුරුව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් අශෝකා අලවත්ත මහත්මිය විසින් පැමිණ සිටි පළාත් පාලන ආයතන සඳහා තේරී පත් වූ මන්ත්‍රීවරියන් හමුවේ කෙටි අදහස් දැක්වීමක් සිදු කරන ලදී.



දිස්ත්‍රික් වනිතා සංවර්ධන නිලධාරී වැඩසටහන ආරම්භ කරන ලද අවස්ථාව



කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් අශෝකා අලවත්ත මහත්මිය අදහස් දක්වන ලද අවස්ථාව

පැමිණ සිටි කොළඹ දිස්ත්‍රික් පළාත් පාලන ආයතන සඳහා තේරී පත් වූ මන්ත්‍රීවරියන් හට ලේකම්තුමිය වෙත ගැටළු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දුන් අතර එහිදී කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් අශෝකා අලවත්ත මහත්මිය, ජාතික කාන්තා කමිටුවේ සභාපති ස්වර්ණා සුමනසේකර මහත්මිය සහ සම්පත් දායිකා නීතිඥ උදේනි තෙවරප්පෙරුම මහත්මිය එම ගැටළු සඳහා පිළිතුරු ලබා දෙන ලදී.



මන්ත්‍රීවරියන් විසින් ලේකම්තුමිය වෙත ගැටළු ඉදිරිපත් කරන ලද අවස්ථාව



සම්පත් දායිකා නීතිඥ උදේනි තෙවරප්පෙරුම මහත්මිය කාන්තා අයිතිවාසිකම් පළිබඳ දේශනය සිදු කරන ලද අවස්ථාව

ඉන් අනතරුව සම්පත් දායිකා නීතිඥ උදේනි තෙවරප්පෙරුම මහත්මිය කාන්තා අයිතිවාසිකම් පිළිබඳ දේශනය ආරම්භ කරන ලදී. එහිදි ප්‍රථමයෙන්ම කාන්තා අයිතිවාසිකම් යනු මොනවද? යන්න පැහැදිලි කරමින් අයිතිවාසිකම් හි ප්‍රභේදයන් මෙන්ම එම අයිතිවාසිකම් තහවුරු කර ඇති ආකාර එනම් දේශීය නීති රාමු මගින් ජාත්‍යන්තර සහ කලාපීය මානව හිමිකම් ප්‍රඥප්ති මගින් යන්න වැඩි දුරටත් ඉතා ගැඹුරින් පැහැදිලි කරන ලදී.

ජාත්‍යන්තර මට්ටමෙන් කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ජාත්‍යන්තරව සකස් කරන ලද සම්මුතීන් හා ආයතන පිළිබදව පැහැදිලි කරන ලදී. එහිදී කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳ කොමිසම (CSW) - (1946), කාන්තවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් බැහැරකිරීමේ සම්මුතිය (CEDAW) (1979), කාන්තවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස් කොට සැලකීම් බැහැර කිරීමේ එක්සත් ජාතීන්ගේ කමිටුව (1982), කාන්තවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් බැහැර කිරීමේ ප්‍රඥප්තිය සම්බන්ධයෙන් වෛකල්පික ප්‍රතිපාදන(1990), වියානා ප්‍රකාශනය සහ ක්‍රියාකාරී වැඩසටහන-(1993), කාන්තවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රකාශනය (DEVAW) - (1993), බීජිං ක්‍රියාකාරීවීම උදෙසා වේදිකාව- (1995) යනාදිය පිළිබඳ දැනුවත් කිරීම සිදු කරන ලදී.

ශ්‍රී ලංකාව තුල කාන්තා අයිතිවාසිකම් තහවුරුකිරීම පිලිබඳවත් පැහැදිලි කරන ලදී. එහිදී රජය විසින් සම්මත කර ඇති ජාත්‍යන්තර සම්මුතීන් සහ ප්‍රඥප්තීන්ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන: 12 වන වගන්ති, නීති අණ පනත් (දණ්ඩ නිති සංග්‍රහය හා ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැලැක්වීමේ පනත ආදී), ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තිය (Women's Charter), කාන්තාවන් උදෙසා ජාතික ක්‍රියාකරී සැලසුම් යනාදිය පිලිබද ගැඹුරින් පැහැදිලි කරමින් කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා කාන්තා දේශපාලන නායිකාවන් ලෙස ඔබට කල හැක්කේ කුමක්ද?යන්න පිළිබඳව සාකච්ඡා කරමින් ඇයගේ දේශනය නිමා කරන ලදී.

ඉන් අනතුරුව ඉන් අනතුරුව ජාතික කාන්තා කමිටුවේ සභාපති ස්වර්ණා සුමනසේකර මිය විසින් පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූල ප්‍රවාහ කිරීම යන මාතෘකාව යටතේ දේශනය ඉදිරිපත් කරන ලදී. එහිදී ස්ත්‍රී පුරුෂ මූල ප්‍රවාහ කිරීම පිලිබඳව දැනුම සහ අවබෝධය ලබා දෙමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු කුමක්ද යන්න පිළිබඳවත් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැය යනු

කුමක්ද පැහැදිලි කරමින් අයවැය ක්‍රියාවලියේ විවිධ අවස්ථාවන්හිදී ස්ත්‍රී පුරුෂ දැක්මකින් කටයුතු කරන ආකාරය ගැඹුරින් පැහැදිලි කරන ලදී. පළාත් පාලන ආයතන හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූල ප්‍රවාහ කිරීම පිළිබඳවත් පළාත් පාලන ආයතන කාර්ය භාරය හා මූල ප්‍රවාහ කිරීමත් පිළිබඳව ඉතා දීර්ඝ වශයෙන් සාකච්ඡා කරමින් දැනුම ලබා දෙන ලදි.



ජාතික කාන්තා කමිටුවේ සභාපති ස්වර්ණා සුමනසේකර මහත්මිය සිය දේශනය ඉදිරිපත් කරන ලද අවස්ථාව



ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී අජන්තා පිරිස් මහත්මිය විසින් සිය දේශනය ඉදිරිපත් කරමින්

ඉන් අනතුරුව මෙම වැඩසටහනේ තෙවන දේශනය ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී අජන්තා පිරිස් මහත්මිය විසින් සිදු කරනු ලද අතර ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ ඉතිහාසය, ළමා අයිතිවාසිකම් අයිතිවාසිකම් පිළිබඳ මූලධර්ම මෙන්ම ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ ව්‍යුහය පිළිබඳවත් පැහැදිලි කරන ලදී.

එමෙන්ම ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාව තුළ ඇති නෛතික පසුබිම මෙන්ම ළමා ආරක්ෂාව වෙනුවෙන් පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන මැදිහත්වීම් පිළිබඳවත් ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන ආයතන මෙන්ම ළමා ආරක්ෂාව සඳහා පළාත් පාලන නියෝජිතයාගේ කාර්ය භාරය පිළිබඳවත් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරමින් එම දේශනය නිමා කරන ලදී.

ඉන් අනතුරුව මෙම දේශන ඇසුරින් සිදු කල අවසන් සාකච්ඡාවවෙන් පසු සහභාගී වූ කාන්තා නියෝජිතවරියක් අදහස් දක්වමින් මෙවන් වැඩසටහන් පැවැත්වීම පිළිබඳ කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ජාතික කාන්තා කමිටුවටත් සිය ස්තූතිය පුද කරන ලදී.

එමෙන්ම නවක මන්ත්‍රීවරියන් ලෙස මෙම ලබා ගත් දැනුම ඉතා වැදගත් වන බවත් මෙම දේශන තුලින් ලත් දැනුම ඉදිරි කාර්යභාරයන් හා වගකීම් ඉටු කිරීමේදී යොදා ගත හැකි බවත් ප්‍රකාශ කරමින් මෙම වැඩසටහන පැවැත්වීමට ඇප කැප වූ සියලු දෙනාටම තුති පුදමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

දිස්ත්‍රික් වනිතා සංවර්ධන නිලධාරී විසින් ස්තූති කතාව සිදු කිරීමෙන් අනතුරුව සවස 3.30 ට පමණ මෙම වැඩසටහන නිමාවට පත්විය.

## පළාත් පාලන ආයතන සඳහා තේරී පත් වූ කාන්තා සභිකයින්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන
## කළුතර දිස්ත්‍රික්කය

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ජාතික කාන්තා කමිටුව විසින් සංවිධානය කරන ලද මෙවර පළාත් පාලන ආයතන සඳහා තේරී පත් වූ කාන්තා සභිකයින් ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් මාලාවේ කළුතර දිස්ත්‍රික් වැඩසටහන 2018.08.17 දින, කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පෙ. ව. 8.30 - ප. ව. 3.30 දක්වා පවත්වන ලදී. එම වැඩසටහන සඳහා මෙවර පළාත් පාලන මැතිවරණයෙන් පළාත් පාලන ආයතන සඳහා තේරී පත් වූ කාන්තා සභිකයින් ඇතුළු 70 ක පිරිසක් සහභාගී විය.

එම වැඩසටහන සඳහා සම්පත් දායකත්වය ලබා දුන් නීති ආධාර කොමිෂන් සභාවේ නීති නිලධාරී නීතිඥ සංජීවනී අබේකෝන් මහත්මිය කාන්තා අයිතිවාසිකම් පිළිබඳ දේශනය පැවත්වන ලදී. ළමා අයිතිවාසිකම් දේශනය ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී සජීවනී මහත්මිය විසින් සිදු කරන ලද අතර ජාතික කාන්තා කමිටුවේ සභාපති ස්වර්ණා සුමනසේකර මහත්මිය විසින් පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූල ප්‍රවාහ කිරීම යන මාතෘකාව යටතේ දේශනය ඉදිරිපත් කරන ලදී.





කළුතර දිස්ත්‍රික් වැඩසටහන සඳහා සහභාගී වූ කළුතර දිස්ත්‍රික් පළාත් පාලන ආයතන සඳහා තෙරී පත් වූ මන්ත්‍රීවරියන් ගෙන් පිරිසක්

# පළාත් පාලන ආයතන සඳහා තේරී පත් වූ කාන්තා සභිකයින්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - ගම්පහ දිස්ත්‍රික්කය

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ජාතික කාන්තා කමිටුව විසින් සංවිධානය කරන ලද මෙවර පළාත් පාලන ආයතන සඳහා තේරී පත් වූ කාන්තා සභිකයින් ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් මාලාවේ කළුතර දිස්ත්‍රික් වැඩසටහන 2018.08.24 දින, ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පෙ. ව. 8.30 - ප. ව. 3.30 දක්වා පවත්වන ලදී. එම වැඩසටහන සඳහා මෙවර පළාත් පාලන මැතිවරණයෙන් පළාත් පාලන ආයතන සඳහා තේරී පත් වූ කාන්තා සභිකයින් ඇතුළු නිලධාරීන් 120 ක් සහභාගී විය.

එම වැඩසටහන සඳහා සම්පත් දායකත්වය ලබා දුන් නීති ආධාර කොමිෂන් සභාවේ නීති නිලධාරී නීතිඥ සංජීවනී අබේකෝන් මහත්මිය කාන්තා අයිතිවාසිකම් පිළිබඳ දේශනය පවත්වන ලදී. ළමා අයිතිවාසිකම් දේශනය ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී ඉලංගනී මහත්මිය විසින් සිදු කරන ලද අතර ජාතික කාන්තා කමිටුවේ සභාපති ස්වර්ණා සුමනසේකර මහත්මිය විසින් පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූල ප්‍රවාහ කිරීම යන මාතෘකාව යටතේ දේශනය ඉදිරිපත් කරන ලදී.

ජාතික කාන්තා කමිටුවේ සභාපති ස්වර්ණා සුමනසේකර මහත්මිය සිය දේශනය ඉදිරිපත් කරන ලද අවස්ථාව



නීති ආධාර කොමිෂන් සභාවේ නීති නිලධාරී නීතිඥ සංජීවනී අබේකෝන් මහත්මිය කාන්තා අයිතිවාසිකම් පිළිබඳ දේශනය පැවත්වන ලද අවස්ථාව





මෙම වැඩසටහන පිළිබඳ මන්ත්‍රීවරියක් අදහස් දක්වන ලද අවස්ථාව



වැඩසටහන සඳහා සහභාගී වූ ගම්පහ දිස්ත්‍රික් පළාත් පාලන ආයතන සඳහා තෙරී පත් වූ මන්ත්‍රීවරියන් ගෙන් පිරිසක්